# ගම්පහ ප්‍රාදේශීය සභාව

# ලංසු ආරාධනයයි

<u>ප්‍රසම්පාදන අංකය DS/04/2025</u>

01. ගම්පහ ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පළාත් සභා වැඩසටහන් ප්‍රතිපාදන මත උපලේඛනයේ විස්තර කර ඇති පරිදි ගම්පහ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු කැඳවනු ලබනුයේ ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුවයි.

03. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට 2025.09.12 දින සිට රජයේ කාර්යාල දිනයන්හි පෙ.ව.9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ ගම්පහ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ සංවර්ධන අංශය වෙත පැමිණ ලංසුපත් පරීක්ෂා කර බැලිය හැකි අතර මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කාර්යාලීය වේලාව තුළ වැඩ අධිකාරී (033-2220145) වෙතින් ලබා ගත හැකිය.

04. 2025.09.12 දින සිට 2025.09.25 දින දක්වා පෙ.ව.9.00 සිට ප.ව.2.00 දක්වා කාලය තුළ ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් **ආපසු නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තුව එක් ව්‍යාපෘතියකට** රු.1000/- + වැට් බැගින් මුදලින් ගෙවා සංවර්ධන අංශයෙන් සම්පූර්ණ ලංසු ලේඛන ලබා ගත හැකිය.

05. ලංසු මුල් හා අනුපිටපත් ලෙස පිළියෙල කර **2025.09.26** වන දින **පෙ.ව.10.00 ට හෝ ඉන් පෙර** ලැබෙන සේ "සභාපති,ගම්පහ ප්‍රදේශීය සභාව,මිරිස්වත්ත,මුදුන්ගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගම්පහ ප්‍රාදේශීය සභාවේ, ප්‍රධාන කාර්යාලයේ, ලේකම් නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය. **ප්‍රසම්පාදන අංකය, ව්‍යාපෘතියේ, අංකය හා නම කවරයේ වම්පස ඉහළ කෙලවරේ** පැහැදිලිව සඳහන් කළ යුතුය. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු, එම ලංසු භාර ගන්නා වේලාව ඉක්ම වූ වහාම පැමිණ සිටින ලංසුකරුවන්/ නියෝජිතයින් ඉදිරියේ දී ගම්පහ ප්‍රාදේශීය සභාවේ කාරක සභා රැස්වීම් ශාලාවේදී විවෘත කරනු ලැබේ.

06. ලංසුපත් ඉදිරිපත් කිරීමේදී CIDA ලියාපදිංචිය තහවුරු කිරීම සඳහා එහි සහතික කළ පිටපතක්ද මුදලින් ලංසු සුරක්ෂණ (ආපසු ගෙවන) තැන්පත් කරන්නේනම්, ගම්පහ ප්‍රාදේශීය සභාවේ තැන්පත් කර එහි ලදුපත හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් හෝ ඉදිකිරීම් රක්ෂණ අරමුදල මගින් ලබාගත් 2025.11.15 දින දක්වා වලංගු ලංසු ඇපකරයක් සමඟ ලංසුව ඉදිරිපත් කළයුතුය.

07. මෙම ලංසු පිළිගැනීම හෝ සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමේ හෝ බලය ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුව සතුය.

බී.ඩී.සෙනරත් පීරිස්,
සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
ගම්පහ ප්‍රාදේශීය සභාව,
මිරිස්වත්ත,
මුදුන්ගොඩ.
2025.09.11

දු.අංකය : 0332220145 ෆැක්ස් : 0332220144

CamScanner